# පාසල් වියේ නවයෞවනයින්ට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පසුබිම සකස්වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

අම්පේ විමලධම්ම හිමි[1], ආචාර්ය සුභාෂිනී විජේසුන්දර[2]

## හැඳින්වීම

දරුවන්ගේ පාසල් අවධිය නව යොවුන් වියට අයත් වේ. නව යොවුන් විය ජීවවිද්‍යාත්මකව හා මානෝවිද්‍යාත්මකව පුද්ගල සංවර්ධනයේදී අතිශය වැදගත් වේ. නවයෞවනයින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම ලොව සියලු දෙනාට බලපෑම් ඇතිකරන ප්‍රබල ගැටලුවක් බවට පත්ව ඇත. විශ්වවිද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතනවල සැලකිය යුතු ප්‍රමාණයකින් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වී ඇත (Tuwei, 2014). මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ද නව යොවුන් විය අත්හදා බැලීමේ අවධියට අයත් වේ. මෙකල නව යෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතය තුළින් සිදුවන්නේ කුමක්ද? යන්න ගවේෂණය කරන කාල වකවානුවකි. මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, ඖෂධයක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන ඍණාත්මක ප්‍රතිඵලවලට වඩා සමාජමය, ප්‍රජානනමය හා ශාරීරිකව පුද්ගලයාට ඍණාත්මක බලපෑමක් ඇතිකරයි (Kuria,1996). නිරීක්ෂණය හා අනුකරණය මත්ද්‍රව්‍ය භාවිතයට ප්‍රබල බලපෑමක් ඇතිකරයි. නව යොවුන් වියේ වීරත්වය අනුකරණය කිරීමට කැමැත්තක් දක්වන අතර සමාජ විද්‍යාත්මකව තමාට හිමි ස්ථානය සොයා යන කාල පරිච්ඡේදයකි. එහිදී අන්‍යයන් අතර නායකත්වය හා උසස් සම්මානනය බලාපොරොත්තු වෙයි. එම ඉලක්කය කරා යාමට අනුකරණය ප්‍රබල සහයක් ලබාදෙන අතර සමාජයේ දක්නට ලැබෙන එවැනි චරිත අනුගමනය කිරීමට පෙළඹෙන්නේ යටකී මානසික අවශ්‍යතාව නිසාවෙනි. මෙම අවශ්‍යතාව ඉටුකර ගැනීමට සමාජයේ පිළිගැනීමක් සහිත යැයි තමා සිතන හා තේරුම් ගන්නා චරිත අනුගමනය කරන්නේ සැබෑ ධනාත්මක වටිනාකම් පිළිබඳ අවබෝධයෙන් නොවේ. දෙමාපියන්ගෙන් කෙනෙකු හෝ ළඟම මිතුරෙකු සුරාපානය කරන්නේ නම්, දුම් බොන්නේ නම් ළමයන් දැඩි සුරාපානය කරන්නන් හෝ දුම් බොන්නන් වීමට ඉඩ තිබේ (Lusly Hellfert & Elbert Angreel, 2004). ධනාත්මක විය යුතු ආකල්ප ඍණාත්මක වීම ද ඍණාත්මක විය යුතු ආකල්ප ධනාත්මක වීම ද සමාජයෙන් ඉගෙන ගන්නා නවයෞවනයා එම ආකල්ප යථාර්ථවාදී ලෙස ම සිතයි. ඊට ප්‍රබල ලෙස බලපාන පුද්ගල සාධකය වන්නේ නවයොවුන් වියේ ඇතිවන මානසික ව්‍යාකූලතාවයි.

[1] ශ්‍රී ලංකා විදුහල්පති සේවය, කෑ/පානකාව මහා විද්‍යාලය, ඇදුරාපොත

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අධ්‍යාපනවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ampedhamma@gmail.com, subw60@gmail.com

### අධ්‍යයනයේ අරමුණු

ශ්‍රී ලංකාවේ පාසල්වියේ නවයෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹීම සඳහා මූලාරම්භය සැපයෙන සමාජය හා පවුල ආශ්‍රිත සාධක හඳුනාගැනීම, එම සාධකවල තීව්‍රතාව අවබෝධකරගැනීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ. මත්ද්‍රව්‍ය සඳහා නව යෞවනයන් පෙළඹීමට බලපාන සාධක සියල්ලක්ම පෞරුෂ දූර්වලතා නිසා ඇතිවන ඒවාම නොවේ. සමාජීය සාධක හා පවුල ආශ්‍රිත සාධක ද ඒ සඳහා බලපායි. මත්ද්‍රව්‍ය ඇබ්බැහියට බලපාන එබඳු නිෂ්ක්‍රීය සාධකයන්හි ස්වභාවය හා එහි තීව්‍රතාව පිළිබඳවත් ඒවා පුද්ගල සංවර්ධනය කෙරෙහි ඇති කරන බලපෑමත් මෙහිදී අවධානයට ලක්විය.

### අධ්‍යයන ක්‍රමවේදය

නවයෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹෙන සමාජය හා පවුල ආශ්‍රිත සාධක හා එහි තීව්‍රතාව පිළිබඳකෙරෙන මෙම අධ්‍යයනයේදී ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිත කරන ලදී.මෙහිදී දත්ත රැස්කිරීමට ගිය අවස්ථාවේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සිටි නවයෞවනයින් 50 දෙනෙකුගේ නියැදියක් (Time sampling)යොදා ගන්නා ලදී. මෙහිදී කල්පිත ගොඩනැගීමක් සිදු නොවූ අතර අධ්‍යයනයට ලක්වන පුද්ගලයින්ගේ දෘෂ්ටි කෝණයන්ගෙන් සත්‍ය අවබෝධ කරගැනීමට අවධානය යොමු විය. පර්යේෂණ භූමිය තුළ නිපදවෙන දත්ත සංඛ්‍යාවිද්‍යාත්මකව විශ්ලේෂණය කර නිගමනවලට එළඹුණි. මෙහිදී ප්‍රශ්නාවලී දත්ත රැස්කිරීමේ උපකරණ ලෙස භාවිත විය.

### දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය

පර්යේෂණ භූමියෙන් රැස්කරගන්නා ලද දත්ත SPSS මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරනු ලැබිණි. ඒ මත පදනම් වී එම දත්ත අර්ථකථනය කෙරිණි. ඒ අනුව වගු ප්‍රතිශත හා ප්‍රස්තාර දත්ත අර්ථකනයන සඳහා යොදාගන්නා ලදී.

### අධ්‍යයනයේ ප්‍රතිඵල

දත්ත විශ්ලේෂණයට අනුව නවයෞවනයින් අතර වැඩියෙන්ම මත්ද්‍රව්‍ය භාවිත වීමේ වයස අවුරුදු 16 වේ. එහි ප්‍රතිශතය 20%කි. එය අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටීමේ වයස වේ. දෙවැන්න වයස අවුරුදු 21 දීය. එහි ප්‍රතිශතය 18%කි. එය සිසුන් අ.පො.ස(උ.පෙළ) විභාගය අවසන් කර නිදහසේ කටයුතු කරන අවධියකි. බොහෝ විට තම රැකියාවක් තුළින් මුදල් උපයන කාලයකි. ජීවිතයේ

වැඩි ස්වාධීනතාවක් ප්‍රදර්ශනය කරන අවස්ථාවකි.පාසල තුළමත්ද්‍රව්‍ය කිසිවක් භාවිත නොකිරීමේ ප්‍රතිශතය 46% කි. භාවිත කිරීම ප්‍රතිශතය 54%කි. එය භාවිත නොකිරීමට වඩා වැඩි අගයකි. නියදියට අනුව වැඩියෙන්ම භාවිත කරන බවට පිළිතුරු දුන් ප්‍රතිශතය 2%කි. සුළු වශයෙන් හෝ මත්ද්‍රව්‍ය පාසල තුළ භාවිත කිරීම සමග සසදන විට පැහැදිලි වන්නේ පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිතවීමක් සිදුවන බවයි.මත්ද්‍රව්‍ය භාවිතයට බලපාන සාධක අනුව වැඩිම බලපෑම ගෙදර පරිසරය වේ. එහි ප්‍රතිශතය 18%කි. දෙවැනි ස්ථානය හිමි වන සාධකය වන්නේ 14% ක ප්‍රතිශතයක්වන විනෝදය හා මහන්සි වී වැඩකිරීම යන සාධකයයි. අඩුම සාධකය වන්නේ මානසික ගැටලු අමතක කිරීම යන සාධකය වේ. එහි ප්‍රතිශතය 4%කි. මත්ද්‍රව්‍ය දිගටම භාවිතය සඳහා බලපෑ හේතු අතරින් ඉදිරියෙන්ම ඇත්තේ යහළුවන්ගේ පෙරැත්තයයි. එහි ප්‍රතිශතය 24%කි. දෙවැනි සාධකය වන්නේ මුල් භාවිතයෙන් ලැබූ වින්දනයයි. එහි ප්‍රතිශතය 20% කි. දිගට භාවිතය සඳහා බලපෑ සාධක අතුරින් අඩුම ප්‍රතිශතය නියෝජනය කරන්නේ මුල් භාවිතයෙන් පසු බිය නැතිවීම යන සාධකයයි. එහි ප්‍රතිශතය 3%කි. ඒ අනුව නවයෞවනයින් මිතුරන් ඇසුර මත්ද්‍රව්‍ය භාවිතය දිගට පවත්වා ගැනීමට යම් බලපෑමක් කරන ප්‍රබල සාධකයක් බව පෙනී යයි.මත්ද්‍රව්‍ය මිළදී ගැනීමට ඇති ළඟම ස්ථානයට දුර මීටර් 10 කි. ඈතින්ම පිහිටි ස්ථානයට ඇති දුර කි.මී. 8 කි. මින් පැහැදිලි වනනේ ඉතා සමීපයේ මත්ද්‍රව්‍ය මිළ දී ගැනීමට අවස්ථාව ඇති බවයි. කිලෝමීටරයකට වඩා දුර ඇති ස්ථනයන්ගේ ප්‍රතිශතය 48% කි. කිලෝමීටරයක් ඇතුළත මත්ද්‍රව්‍ය මිළදී ගත හැකි ස්ථාන නියැදියට අනුව 52%කි. ඒ අනුව සුළභතාව පිළිබඳ මූලධර්මය ක්‍රියාත්මක වීම දැකිය හැකිය.

## සාකච්ඡාව හා නිගමන

සමස්තයක් ලෝකය පුරාම මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවීමේ ප්‍රවනතාවක් දක්නට ලැබේ. 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අවුරුදු 15 - 24 අතර වන නවයෞවනයින් තුළ ද මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වූ ප්‍රමාණයේ ප්‍රතිශතය 15% කි (National Dangerous Control Boards,2016). පාසල් පරිසරය හා නිවසේ වටපිටාව වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවිමට බලපා ඇත. එම නිසා එම පරිසරයේ ඇති අහිතකර සාධක ඉවත් කිරීම වඩා වැදගත්ය. දෙමාපියන් දැඩි රැකවරණය යටතේ දරුවන් ඇති දැඩි කිරීම නිසා දරුවන්ට ස්වාධීනීමට ඇති අවස්ථා ඇහිරී ගොස් ඇති බව පෙනී යයි. ඒ නිසා නවයෞවනයාගේ පෞරුෂය සමබර ලෙස සංවර්ධනය වීමක් සිදු නොවේ. ඉන් පෞරුෂය පරාරෝපණය වන අතර මත්ද්‍රව්‍ය භාවිතයට ද යොමුවීමක් මෙම අධ්‍යයනය තුළින් දැකගත හැකිවිය.

අන්‍යයන් අතර වීරයෙක් වීමේ ආශාව මෙම අවධියේ ඇතිවන අතර එයට ඇති කෙටිම මාර්ගය වැරදි ක්‍රියාවල නිරත වීම බව දරුවා තම සංස්කෘතික වටපිටාවෙන් ඉගෙන ගනියි. වැරදි ක්‍රියාවලින් සමාජයේ මතුව සිටින තම සංස්කෘතික වටපිටාවේ චරිත අනුකරණය කිරීම හා එවැන්නන් වීමට තමා උත්සාහ කිරීම නිසා නවයෞවනයා වැරදි ක්‍රියාවන්ට යොමු වේ. හොඳ නරක හඳුනාගැනීමට නොහැකි වීමත් තම නිවස් වටපිටාවේ මත්ද්‍රව්‍ය සුළභ වීමත් යන සාධක මත මත්ද්‍රව්‍යවලට යොමුවිම සිදු වේ.නවයෞවන අවධිය වීරත්වය වැනි හැඟීම්වලින් ගහන යුගයක් වන අතර තමාට ලැබෙන වීරත්වය රැක ගනීමට නම් මත්ද්‍රව්‍ය භාවිත කළ යුතුය යන වැරදිසහගත හැඟීමක් හා ආකල්පයක් ඔවුන් තුළ පවතී. ඒ අනුව නවයොවුන් වියේ පාසල් යන දරුවන් තුළ විරත්වය වැනි ආකල්ප අර්ථාන්විතව ගොඩනැගීමට අධ්‍යාපන පද්ධතිය කටයුතු කළ යුතුය.මත්ද්‍රව්‍ය සුළභවීම මත නවයෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුව ඇත. මෙහිදි නිවස ආසන්නයේ මත්ද්‍රව්‍ය වෙළඳාම් කිරීම නිසා බොහෝ නවයෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතයට නිරායාසයෙන් යොමු විමක් දක්නට ඇත. නවයොවුන් වියට ඒමට පෙර සිට ම ළමා සංවර්ධනය පිළිබඳ වැඩි අවධානයක් රටක් ලෙස යොමුකළ යුතුය. නීතිය ක්‍රියාත්මක වීම දූනට පවතිනවාට වඩා බලගතු විය යුතුය. නීතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම විශේෂ ගැටලුවක් ලෙස මෙහිදී පෙන්වා දිය හැකිය. 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්මය සහ මූලික යුතුකම් පිළිබඳ වන vi වන පරිච්ඡේදයේ 27(13) යටතේ ළමයින් සහ යෞවනයින් කායික, මානසික හා සදාචාරාත්මක, ආගමික වශයෙන් පූර්ණ වර්ධනයට රජය වගබලා ගත යුතුය.එහෙත් එය ඉටුවන ප්‍රමාණය ගැන සෑහීමකට පත්විය නොහැකිය.මත්ද්‍රව්‍ය සකස් කරන්නේ මනා වූ බුද්ධිමය හැකියාවක් ඇති අය වේ. තම බුද්ධිමය හැකියාව වැරදියට යෙදවීමෙන් සිදුවන සමාජ අයහපත ගැන ඔවුහු නොසිතති. වැඩිහිටියන්ට සාපේක්ෂව බුද්ධිමය හැකියාව අඩු නවයෞවනයින් එම මත්ද්‍රව්‍ය හරහා තම ජීවිතය අවාසනාවන්ත තත්ත්වයකට පත්කර ගනියි. අධ්‍යාපනයේදි, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීමේන් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක නිදර්ශන සහිතව පන්තිකාමරයේදි සිසුන්ට අවබෝධ කර දීමත් නවයෞවනයාගේ ජීවවිද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සංවර්ධනය පිළිබඳ කරුණු සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනයට ඇතුළත් කිරීමත් කාලෝචිතය. මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්විම සඳහා ප්‍රජාව තවදුරටත් දැනුවත් කිරීම, පුහුණු කිරීම, පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වළක්වා ගැනීම හා ඔවුන් මානසිකව ශක්තිමත් කිරීම කළ යුතුය. මානසික ලෙස ශක්තිමත් හා සමබර පෞරුෂයක් සහිත අනාගත පුරවැසියන් නිර්මාණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. මත්ද්‍රව්‍ය

භාවිතය පිළිබඳ ඇතැම් අය තුළ ඇති ධනාත්මක ආකල්ප නැවත සෘණාත්මක තත්ත්වයට පත්කළ යුතුය. මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදී පුනරුත්ථාපනය වන නවයෞවනයින්ට ඇති සමාජ පිළිගැනීම පෙර පැවති පරිදි ම සෘණාත්මක වීම නිසා ඔවුන් මානසිකව බිඳ වැටීමක් සිදුවේ. පුනරුත්ථාපනය වන නවයෞවනයින්ට සමාජයේ ඉහළ පිළිගැනීමක් ඇතිකිරීමට කටයුතු කළ යුතුය.රටේ සංවර්ධනයට ඔවුන්ගේ හැකියාවන් යොමුකිරීමක් සිදුවිය යුතුය. පෞරුෂ සාධක, සමාජ සාධක හා මත්ද්‍රව්‍ය සුළභවීම නවයෞවනයින් මත්ද්‍රව්‍ය භාවිතයට අවශ්‍ය පසුබිම සකස් කරන බව පෙනී යයි. එසේ හෙයින් නවයෞවනයින්ට අධ්‍යාපනයේදී සාරධර්ම හා සමාජ හර පද්ධතීන් පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබාදීම මත්ද්‍රව්‍ය නිවාරණයට වඩාත් ප්‍රායෝගික ප්‍රවේශයක් වනු ඇත.

ප්‍රමුඛ පදඃ අත්හදා බැලීමේ අවධිය, නව යොවුන් විය, මත්ද්‍රව්‍ය භාවිතය,
පරාරෝපණය

ආශ්‍රිත ග්‍රන්ථ

Andrew E. van zyl. (2013)."Drugs use amongst south African youths: Reasons and solution".*Mediterranean Journal of Social Sciences*.Rome-Italy, MCSER Publishing.

Kuria M.W. (1996)."Drug abuse among urban as compared to rural secondary schools students in Kenya: a short communication," East Africa Med J.

Tuwei, Patricia carin. (2014).Influence of drug abuse on students academic performance in public universities. A case of usinggishu county in Kenya, Research project submitted in partial fulfilment for the award of the degree of master of arts in project planning and management of the university of Nairobi, Handbook of drug abuse information (2016), (2016) National dangerous Drugs Control Board, Sri Lanka.

Lusly Hellfert & Elbert Angreel. (2004).*<ud මනෝවිද්‍යාව*. (පරි.) ටී.එස්. ද එස්. ගුණවර්ධන, වැල්ලම්පිටිය, චතුර මුද්‍රණාලය.